# සංවර්ධනය සහ ගෝලීයකරණය තුළ අතරමං වූ පරිසරය

ගෝලීයකරණය, ජගත්කරණය, ප්‍රෘථිවිකරණය ලෝකකරණය, විශ්ව ගම්මාන සංකල්පය ආදී වචන මේ වනවිට අපට ඉතාමත් හුරු පුරුදු ඒවා බවට පත් ව ඇත. ගෝලීයකරණය යන්න විග්‍රහ කිරීමේ දී එය අංශ කිහිපයක් ඔස්සේ සාකච්ඡා කළ හැකි පුළුල් සහ සංකීර්ණ ක්‍රියාවලියක් බව පෙනේ. සරල වශයෙන් විග්‍රහ කළහොත් ගෝලීයකරණය යනු ලෝක ජනතාව ඔවුනොවුන් වෙත වඩාත් සමීප කරවමින් ආර්ථික, සංස්කෘතික, සමාජමය, දේශපාලන, තාක්ෂණික ආදී විවිධ අංශවලින් අන්‍යෝන්‍ය රැඳියාවක් ඇති කරවන ක්‍රියාදමයකි. නැතහොත් සමස්ත ලෝකය තුළ ම වෙළඳම, තාක්ෂණය, විදේශ අයෝජනය ආදී විවිධ අංශවලට නීතිරීති බලපෑම්වලින් තොරව නිදහසේ චලනය වීමට ඉඩකඩ ලබාදීමය. මෙය නව ක්‍රියාදමයක් නොවන අතර ම විවිධ යුගයන් හි දී විවිධාකාර වූ නම්වලින් ගෝලීයකරණ අත්දැකීම ලොව විවිධ රටවල් විසින් අත්දැක ඇත. ගෝලීයකරණ ක්‍රියාදමය තුළ සාමාන්‍යයෙන් සිදුවන්නේ කාර්මික රටවල් විසින් සංවර්ධනය වන රටවල් ගෝලීකරණ ක්‍රියාදමයට අවශෝෂණය කර ගැනීම නිසා මෙය එක් දිශාවකට පමණක් ක්‍රියාත්මක වන්නක් ලෙසින් සැලකිය හැකිය. සංවර්ධනය වෙමින් පවතින රටවල් ආර්ථික, දේශපාලනික, සමාජමය, සංස්කෘතික, තාක්ෂණික ආදී සියලු හෝ බොහෝ අංශවලින් බටහිරකරණය වීමේ ක්‍රියාදමය ගෝලීයකරණය ලෙසින් එක් අතකින් හඳුන්වා දිය හැකිය. මෙහි දී ලොව සියලුම රටවල අන්තර් රැඳියාව ඉහළ යන අතර රටවල් අතර භාණ්ඩ සහ සේවා හුවමාරුව වේගවත් වේ. එමෙන් ම, ජාත්‍යන්තර වශයෙන් සිදුවන මුදල් සහ ප්‍රාග්ධන සංසරණයත් තාක්ෂණයේ බල මහිමයත් හේතුවෙන් ජාතික වෙළඳපොළවල් අන්තර්ජාතික වශයෙන් එක් වෙළඳපොළක් තුළට ගොනු කර ඇත. මෙහි දී භාණ්ඩ සහ සේවා නිෂ්පාදනය, බෙද හැරීම සහ අලෙවිය, ආයෝජනය ආදී සියලුම අංශ අන්තර් ජාතිකකරණය වී ඇත. ආර්ථික වශයෙන් ලොව රටවල් එසේ ගෝලීයකරණය වන විට ප්‍රජාතන්ත්‍රවාදය, මූලික සහ මානව අයිතිවාසිකම්, පාලනයේ විනිවිද පෙනෙන සුළුබව රාජ්‍ය නොවන සංවිධානවල වේගවත් ව්‍යාප්තිය ආදිය තුළින් දේශපාලනමය වශයෙන් ද ගෝලීකරණයට හසු වී ඇත. ක්ෂණික ආහාර, සුඛෝපභෝගී ජීවන රටාව, බටහිරකරණය වූ චර්යාව, පොප් සංගීතය ආදී විවිධ අංශවලින් සංස්කෘතිකමය වශයෙන් සංවර්ධනය වන රටවල් ගෝලීයකරණයට ලක් ව ඇත. මෙයට අමතර ව විවෘත ආර්ථිකය, නව ලිබරල්වාදී අදහස්, විවිධ ආර්ථික සහ රාජ්‍ය ප්‍රතිපත්ති ගෝලීයකරණයට පිටුබලයන් වී ඇත. මේ සියලු කරුණුවලට වඩා වැදගත් උත්තේජකයක් වී ඇත්තේ නවීන තාක්ෂණය බව ගෝලීයකරණයේ ව්‍යාප්තිය තුළින් පෙන්නුම් කරනු ලබයි.

තාක්ෂණයේ දියුණුව, ජනගහන වර්ධනය, සංවර්ධන අවශ්‍යතා වර්ධනය වීමේ නැඹුරුව තුළ ගෝලීයකරණ ක්‍රියාදමයේ දී භාණ්ඩ සහ සේවා පරිභෝජන අවශ්‍යතා ඉහළ ගොස් ඇති අතර එම අවශ්‍යතා සපුරාලීම වෙනුවෙන් පරිසරයේ පවතින සම්පත් ඉතාම වේගයෙන් භාවිතා කිරීමේ නැඹුරුවක් පවතී. මෙහිදී පරිසරයට සිදුවන බලපෑම බිහිසුණු එකක් වන අතර එහි ප්‍රතිවිපාක ද අතිශයින් බිහිසුණු සහ අභියෝගාත්මක තත්ත්වයක් උද්ගත කරන්නක් වේ.

ගෝලීයකරණ ක්‍රියාදමය තුළ පරිභෝජන අවශ්‍යතා වේගයෙන් ඉහළ යන අතර ම පරිභෝජන විෂමතාව ද උග්‍ර ලෙසින් පවතී. මෙහි දී වැඩි වාසි සැලසෙන්නේ සංවර්ධිත තත්ත්වයේ පවතින රටවල්වලට බව පෙනේ. ලොව පොහොසත් ම 1/5 ලොව දුප්පත් ම 1/5 මෙන් 16 ගුණයක සම්පත් පරිභෝජනයක් සිදු කිරීමෙන් එය මනාව තහවුරු වේ. ලෝක ජනගහනයෙන් පොහොසත් ම 1/5 ලොව සියලුම මස් සහ මාළු නිෂ්පාදනයන්ගෙන් 45% ක් ද සියලුම කඩදසි නිෂ්පාදනයන්ගෙන් 84% ක්ද මෝටර් රථවලින් 75%ක් ද පෙට්‍රල් නිෂ්පාදිතයෙන් 75% ද පරිභෝජනය කරනු ලබයි (කැලේගම, සමන්, 2000,11). මෙහි දී සිදුවන්නේ සංවර්ධනය වෙමින් පවතින රටවල් සතු සම්පත් අනාගත අවශ්‍යතා පිළිබඳ ව හෝ නො තකමින් අමුද්‍රව්‍ය ලෙසින් කාර්මික සහ සංවර්ධිත රටවල් වෙත අඩු මිලකට ආනයනය කිරීමය. එසේ නැතහොත් එම රටවල සම්පත් අඩු මිලකට මිල දී ගෙන එම රටවල පවතින ශ්‍රමය ද යොදා ගනිමින් නිෂ්පාදිත බවට පත්කර වැඩි මිලකට අලෙවි කිරීම ය. මෙහි දී

**එම්.කේ.නදීකා දමයන්ති**
*පර්යේෂණ නිලධාරිණී,*
**කෘෂි ප්‍රතිපත්ති සහ ව්‍යාපෘති ඇගයුම් අංශය,**
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු
පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය.

එක් අතකින් සංවර්ධනය වෙමින් පවතින රටවල සම්පත් අඩු මුදලකට කොල්ලකෑමක් සිදුවන අතර ම එම සම්පත් ලබාගැනීමේ දී බොහෝවිට අනුගමනය කරන පරිසර හිතකාමී නොවන ක්‍රියාමාර්ග නිසා පරිසරයට සිදුවන හානිය බොහෝ විට නැවත සැකසීමට නොහැකි තරම් දරුණු වන බව පෙනේ. උදහරණ වශයෙන් ඉන්දුනීසියාවේ ඉරියන් ජායා ප්‍රදේශයේ 'ෆ්‍රී පෝර්ට් මැක්මොරන්' නම් සමාගම විසින් තඹ සඳහා කරන පතල් කැණීම්වලින් පසුව ඉවත දමනු ලබන අපද්‍රව්‍ය ටොන් මිලියන 70ක් බැගින් වාර්ෂිකව අජ්ක්වා (Ajkwa River) ගංඟාවට එකතු කිරීම තුළින් සිදුවන දූෂණය පෙන්වා දිය හැකිය.

තාක්ෂණයේ දියුණුවත් සමඟින් පරිසරයට සිදුවන හානිය ඉහළ යමින් පවතින අතර එම විනාශය අංශ කිහිපයක් ඔස්සේ සාකච්ඡා කිරීමට හැකිය. ඉන්ධන දහනය, දව, වගා බිම් ආදිය සඳහා වනාන්තර හෙළි පෙහෙළි කිරීම, ජෛව විවිධත්වය විනාශවීම, පරිසර දූෂණය, අම්ල වැසි ලැබීම, ඕසෝන් ස්ථරය තුනී වීම සහ පරිසර උෂ්ණත්වය ඉහළ යාම, පාංශු ඛාදනය, වෙරළ ඛාදනය ආදිය මේ අතර ප්‍රමුඛ වේ.

තාක්ෂණයේ දියුණුව සමඟින් යන්ත්‍ර සූත්‍ර, වාහන ආදිය පරිහරණය කිරීම බෙහෙවින් ඉහළ ගොස් ඇති අතර මේවා ක්‍රියා කරවීමට අවශ්‍ය ශක්තිය ලබා ගැනීම සඳහා පොසිල ඉන්ධන මෙන් ම විදුලි බලය ද උපයෝගී කර ගැනේ. 1950 සිට මේ දක්වා පොසිල ඉන්ධන දැවීම පස් ගුණයකින් ඉහළ ගොස් ඇති අතර පොසිල ඉන්ධන මේ ආකාරයට අරපිරිමැස්මෙන් තොරව භාවිතා කිරීමෙන් අනාගතයේ දී ඒවා ක්ෂයවීමේ හෝ මුළුමනින්ම නැතිවීයාමේ අවදානමකට ලොව මුහුණ දෙනු ඇත. වර්තමානයේ කාර්මික රටවල ඒක පුද්ගල බලශක්ති පරිභෝජනය සංවර්ධනය වන රටවල මෙන් 07 ගුණයක් වන අතර දකුණු ආසියාවේ මෙන් දහතුන් ගුණයකට ආසන්න වේ. මෙයින් ද පැහැදිලි වන්නේ ලොව සම්පත්වලින් අතිබහුතරය කාර්මික රටවල් විසින් භුක්ති විඳිනු ලබන බවයි.

දව පරිභෝජනය ද සංවර්ධන සහ මිනිස් අවශ්‍යතාවල වර්ධනයත් සමඟින් වේගයෙන් ඉහළ ගිය අංශයකි. මේ වන විට, මෙයට වසර 25ට පෙර තිබූ දව පරිභෝජනය මෙන් 40%න් ඉහළ මට්ටමක දව පරිභෝජනයක් ලොව පුරා සිදු වේ. මෙහිදී දව සඳහා නිවර්තන වනාන්තර විනාශ කිරීම ශීඝ්‍රයෙන් සිදුවන අතර මේ වෙනුවෙන් විනාශ කෙරෙන වනාන්තර ප්‍රමාණය වර්ෂයකට හෙක්ටයාර් මිලියන 15.4කි. නැතිනම් විනාඩියකට අක්කර 72කි. වනාන්තර හෙළිකිරීම නිසා කාන්තාරීකරණය, මිහිතලය උණුසුම් වීම, ඕසෝන් ස්ථරය තුනීවීම, අම්ල වැසි, නියඟය, ජල මූලාශ්‍ර විනාශ වීම, කාලගුණ විපර්යාස ඇති වීම ආදී අහිතකර ප්‍රතිඵලවලට මුහුණ පෑමට සිදු වී ඇත.

ජනගහන ඝනත්වය ඉහළ මට්ටමක පවතින ශ්‍රී ලංකාවේ 19වැනි සියවස මුල්භාගය වනතෙක් කඳුකර සහ පහත රට වියළි කලාපය වන ආවරණයෙන් වැසී තිබූ අතර උතුරු නැගෙනහිර සහ ගිනිකොන දිග ප්‍රදේශවල වනපෙත පැතිරී තිබුණි. යටත් විජිත යුගයේ ආරම්භයත් සමඟ හඳුන්වා දුන් කෝපි සහ තේ වගාවන් සඳහා මධ්‍ය කඳුකරයේ වනාන්තර විශාල ප්‍රමාණයක් හෙළි පෙහෙළි අතර ඉන් පසු ව සිදු වූ ජනපද පිහිටු වීම සහ වෙනත් සංවර්ධන කටයුතු සඳහා ද විශාල වශයෙන් වනාන්තර විනාශ කෙරිණි. 1881 වන විට ශ්‍රී ලංකාවේ සම්පූර්ණ භූමි ප්‍රමාණයෙන් 84%ක් වන ආවරණයෙන් වැසී පැවති අතර 1992 වන විට එය 23.9% දක්වා පහළ වැටුණි. කෙසේ වුව ද 1995 චන්ද්‍රිකා දත්ත අනු ව ශ්‍රී ලංකාවේ මුළු භූමි ප්‍රමාණයෙන් 24%ක් පමණ වැසුණු වියනින් ආවරණය වූ වනාන්තර ලෙසත් විවෘත නො වූ වන ප්‍රදේශය 7%ක් ලෙසත් හඳුනාගෙන තිබිණි. මෙහි දී 1992 දී චන්ද්‍රිකා දත්ත අනු ව හඳුනාගත් හානියට පත් හෙක්ටයාර් 4055ක් පමණ භූමි ප්‍රදේශයක වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් මහෝගනී ශාක සිටුවීමෙන් වන වගා ප්‍රදේශ බවට පත් කර ඇත. ශ්‍රී ලංකාවේ දනට පවතින ප්‍රධාන ම නිවර්තන වැසි වනාන්තරය වන සිංහරාජයේ ශාක අතුරින් 75%-92% අතර ප්‍රමාණයක් මෙ රටට අවේණික ඒවා වන අතර විශාල ජෛව විවිධත්වයක් රැඳී පවතී. මෙක්සිකෝවේ වියා පාස් වැසි වනාන්තරයේ එක් හෙක්ටයාරයක ශාක විශේෂ 30ක්, උඩවැඩියා විශේෂ 50ක්, පක්ෂි විශේෂ 40ක්, ක්ෂීරපායි විශේෂ 20ක්, සමනලුන් විශේෂ 300ක්, කෘමි විශේෂ 5000ට අධික ප්‍රමාණයක් වාර්තා වන අතර මේවා ආරක්ෂා කර ගැනීම ජාත්‍යන්තර වගකීමක් බවට පත් ව ඇත.

වනාන්තර විනාශ වීමත් සමඟ මතුවන තවත් ප්‍රශ්නයක් වන්නේ ජෛව විවිධත්වය විනාශයට පත් වීමයි. මේ වන විට දත්ත ලබා ගැනීමේ හැකියාව පවතින මත්ස්‍ය විශේෂ 25%ක් පමණ සම්පූර්ණයෙන් ම අහෝසි වී හෝ අහෝසි වීමේ අවධානමට ලක් ව ඇත. තවත් මත්ස්‍ය විශේෂ 44%ක් ජෛව විද්‍යාත්මක සීමාව දක්වා ම ඇල්ලීම සිදු වේ. ඊළඟ ශත වර්ෂය අවසාන වන විට

සියලුම කුරුළු, ක්ෂීරපායි, සමනළ සහ ශාක විශේෂවලින් 2/3 ක් පමණ වඳ විය හැකි බවට අනාවැකි පළ වේ.

ශ්‍රී ලංකාව පිළිබඳ සලකා බැලුවහොත් ක්ෂීරපායි වර්ග 44%ක්, පක්ෂි වර්ග 13ක්%, උරග විශේෂ 70ක්%, මිරිදිය මසුන් වර්ග 46ක්%, සමනලුන් විශේෂ 33ක්%, මකුළු විශේෂ 4ක්% වඳ වී යාමේ තර්ජනයකට මුහුණ පා ඇත. බුරුත, කළුවර, කලුමැදිරිය, නැඳුන් දුලබ ශාක ලෙසින් සැලකෙන අතර මදරා සම්පූර්ණයෙන් ම වඳ වන ප්‍රමාණයට පරිභෝජනය කර ඇත. එමෙන් ම, වනාන්තර ආශ්‍රිත ව හමුවන ඕකිඩ් විශේෂ 170කින් Dendrobium maccarthiae, D. Heterocarpium, Ipsea speciosa සහ Rhyncostylus retusa ආදී වර්ග 13ක් වඳ වී යාමේ තර්ජනයට ලක් ව ඇත. මෙයට අමතර ව ශ්‍රී ලංකාවේ අලි ඇතුන් සංඛ්‍යාව ඉතා ම පහළ මට්ටමකට බැස ඇති අතර 1950 න් පසුව අවේණික සර්ප විශේෂ 14ක් පිළිබඳ තොරතුරු වාර්තා වී නොමැත.

පහත දක්වෙන දත්තවලට අනු ව ශ්‍රී ලංකාවේ ආවේණික සනාල ශාකවලින් (බීජ ශාක සහ පර්ණාංග Vascular Plants) 53%, සපුෂ්පි ශාක (Phylum Angiospermophyta)2 විශේෂ වලින් 26%ක්, සමනල් වර්ග 79%ක්, ගොඩබිම මෘදුවංශින්ගෙන් 76%ක්, මිරිදිය මසුන් වර්ග 97%ක්, උභය ජීවීන් විශේෂ 100%ක්, උරග විශේෂ 99%ක්, පක්ෂි වර්ග 71%ක්, ක්ෂීරපා වර්ග 92% අවධානමට ලක් ව ඇති බව පැහැදිලි වේ. ශ්‍රී ලංකාවේ රතු දත්ත ජීවී ලැයිස්තුවෙන් මෙය තව දුරටත් පැහැදිලි වේ.

**ශ්‍රී ලංකාවේ රතු දත්ත ජීවී ලැයිස්තුව**

**කුහුඹුවන්**

ශ්‍රී ලංකා රිලික්ට් ඇන්ට් - Aneuretus simoni - CR

**මුහුදු ද්විකපාටික බෙල්ලන්**

- Tridacna maxima LR
- Tridacna squamosa LR

**සමනළයින් හා සලබයින්**

| | | |
|---|---|---|
| සිලෝන් ට්‍රී නෙම්ප් | - Idea tyneus jasonia | - LR |
| සිලෝන් ටයිගර් | - Parantica taprobana | - LR |
| ශ්‍රී ලංකා රෝස් | - Pachliopta jophon | - CR |
| ශ්‍රී ලංකා ෆයිව්බා | - Graphoum antipdates | |
| ස්වෝඩ් ටේල් | Ceylonicus | - NE |

**මිරිදිය මත්ස්‍යයින්**

| | | |
|---|---|---|
| කර ඇඳයා | - Danio aequipinnatus | - DD |
| පතිරණ සාලයා | - Danio pathirana | - CR |
| ගල් පාඩියා | - Garra phillipsi | - DD |
| ගඩයා | - Labeo fisheri | - EN |
| තඹලයා | - Labeo lankae | - CR |
| අසෝක පෙතියා | - Puntius asoka | - EN |
| බන්දුල පෙතියා | - Puntius bandyta | - CR |
| දෙපුල්ලියා | - Puntius cumingti | - LR |
| දුම්බර පෙතියා | - Puntius martenstynii | - EN |

**ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වය අවධානමට ලක්වී ඇති ආකාරය**

| කාණ්ඩය | විශේෂ | | | ආවේණික විශේෂ | | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | අවධානමට ලක්වූ | | සංඛ්‍යාව | අවධානමට ලක්වූ | |
| | | ජාතික මට්ටමින් | ගෝලීය මට්ටමින් | | ජාතික මට්ටමින් | ගෝලීය මට්ටමින් |
| සනාල ශාක | 314 | 90 | 36 | 57 | 30 | 35 |
| විවෘත බීජක ශාක | 01 | 01 | 0 | 0 | 0 | 0 |
| සපුෂ්පි ශාක | 3368 | 487 | 413 | 879 | 227 | 399 |
| සමනලුන් | 242 | 81 | 03 | 14 | 11 | 03 |
| මකුළුවන් | 400 | 14 | 0 | 0 | 0 | 0 |
| ගොඩබිම | 266 | 152 | 0 | 201 | 152 | 0 |
| මිරියදිය මසුන් | 65 | 30 | 19 | 29 | 28 | 19 |
| උභය ජීවීන් | 48 | 29 | 0 | 29 | 29 | 0 |
| උරගයින් | 162 | 113 | 9 | 79 | 78 | 1 |
| පක්ෂින් | 419 | 56 | 8 | 24 | 17 | 6 |
| ක්ෂීරපායින් | 89 | 39 | 9 | 12 | 11 | 0 |

**මූලාශ්‍ර: පරිසර පුවත් 1999 ඔක් - දෙසැ. පරිසර අමාත්‍යාංශය**

| | | |
|---|---|---|
| බුලත් හපයා | - Puntius nigrofasciatus | - LR |
| හීත මස්සා | - Puntius pleurotaenia | - LR |
| ලේ තිත්තයා | - Puntius titteya | - LR |
| හල්මල් දණ්ඩියා | - Rasbora vaterifloris | -LR |
| විල්පිට දණ්ඩියා | - Rasbora wilpita | -EN |
| ජෝන්ක්ලාස් අහිරාවා (පුල්ලි අහිරාවා) | - Lepidocephalichthysis jonklaasi | -EN |
| වයිරන් අහිරාවා | - Acanthocobilis urophthalmus | -LR |
| පොඩි හුංගා | - Heterotmeustes microps | -VU |
| බටකොල තෙලියා | - Macrogmathus aral | - DD |
| කට රතු වැලි ගොව්වා | - Schimatogovius deraniyagalai | -DD |
| ගල් වැලි ගොව්වා | - Sicyopterus halei | -LR |
| තල් කොස්සා | - Belontia signata | -LR |
| මල් පුළුට්ටා | - Malpulutta kretseri | -LR |
| ජෝන්ක්ලාස් වැලිගොව්වා | - Sicyopus jonklaasi | -LR |

**උරගයින්**

| | | |
|---|---|---|
| ඇලි කිඹුලා | - Crocodylus palustris | |
| දති කොන්ද රහිත කටුස්සා | - Calotes liocephalus | -EN |
| පෙති අං කටුස්සා | - Ceratophora tennentii | -EN |
| පිඹුරා | - Pythonmolurus | -LR |
| ගල් ඉබ්බා | - Melanochelys trijuga | -DD |
| සියළු මුහුදු කැස්බෑවන් | - All marine turtles | -CR |

**ක්ෂිරපායින්**

| | | |
|---|---|---|
| හික් මීයා හෝ කුණු මීයා | - Crocidura miya (Long - tailed shrew) | -EN |
| හික් මීයා හෝ කුණු මීයා | - Feroculus feroculus (Kelaart's long - clawed shrew) | -EN |
| හික් මීයා හෝ කුණු මීයා | - Solisorex pearsoni (Pearsons Long -clawed shrew) | -EN |
| පොඩි හික් මීයා හෝ පොඩි කුණු මීයා | - Suncus fellowsgordoni - (Pearsons long - clawed shrew) | -EN |
| මීයා | - Suncus montanus | -VU |
| කුණු මියා | - Suncus zeylanicus (Sri Lanka jungle shrew) | -EN |
| දිගු පියාපත් වවුලා | - Miniopterus schreibersi | -LR |
| උන හපුළුවා | - Loris tardigradus | -VU |
| රිළවා | - Macaca sinica | -LR |
| ඇලි වඳුරා | - **Semnopithecus entellus** | **- LR** |
| කළු වඳුරා | - **Trachypithecus entellus** | **-VU** |
| දිවියා | - Panthera pardus kotiya | -EN |
| කොල දිවියා | - **Prionailurus rubiginosus** | **-DD** |
| අඳුන් දිවියා | - Prionailurus viverrinus | - LR |
| වලහා | - Melursus ursinus | -VU |
| ඩොල්පින් | - Sousa chinensis | -DD |
| මුහුදු ඌරා | - Dugong dugon | -VU |
| අලියා | - Elephas maximus | -EN |
| විල් මුවා | - Axis porcinus | -LR |
| කබල්ලෑයා | - Manis crassicauda | -LR |
| දඬුලේනා | - Ratufa macroura | -VU |
| මීයා හෝ පොඩි මීයා | - Mus mayori (spiny mouse) | -LR |
| මීයා හෝ කැලෑ මීයා | - Rattus montanus (Nillu rat) | -LR |
| මීයා හෝ කැලෑ මීයා | - Srilankamys ohiensis (Bicoloured rat) | -LR |
| මීයා | - Vandeluria nolthenii (Sri Lanka Long-tailed tree mouse) | -VU |

**පක්ෂීන්**

| | | |
|---|---|---|
| තිත් හොට පැස්තුඩුවා | - Pelecanus philippensis | - VU |
| අහිකාවා | - Anhinga melanogaster | - LR |
| ආසියා විවර තුඩුවා | - Anastomus oscitans | - LR |
| හීන් බහුරු මානාවා | - Leptoptilos javanicus | - VU |
| ලතු වැකියා | - Mycteria leucocephala | - LR |
| ඉන්දු සුදු දකැත්තා | - Thrsekiomis melanocephalus | - LR |
| සුදුමැලි හැරිකුස්සා | - Circus macrourus | - LR |
| රංචු කිරළා | - Vanellus gregarius | -VU |
| හැඳි හින්නා | - Eurynorhynchus pygmeus | -VU |
| මයිල ගොයා | - columba toringtoni | -VU |
| බට ඇටි කුකුළා | - Centropus Chlorirhyncyhus | - EN |
| වත රතු මල් කොහා | - Phaenicophaeus Pyrrhocephalus | - EN |
| උකුසු බකමූණා (උලමා) | - Bubo nipalensis | - LR |
| පිට තඹල වන බස්සා | - Glaucdium castanonotun | - LR |
| මැඩි මුහුණා (ගෙම්කට බස්සා) | - Batrachostomus moniliger | -LR |
| පෝරු කෑදැත්තා | - Anthracoceros coronatus | -LR |
| කහ කොණ්ඩයා | - Pycnonotus penicillatus | -LR |
| හම්බුකුරුල්ලා (වනරුවියා) | - Bradypterus palliseri | -LR |
| අඳුරු නිල්මැසි මාරා | - Eumyias sordida | -LR |
| කාශ්මීර රත්-මැසි මාරා | - Ficedula subrubra | -VU |
| අළු දෙමලිච්චා | - Garrulax cinereifrons | -VU |
| ළය බොර මැසි මාරා | - Muscicaps muttui | -LR |
| උරුවන් තිරාසිකයා (අරංගයා) | - Myiophoneus blighi | -EN |
| තිත්පිය තිරාසිකයා (පුල්ලි වල් අවිච්චියා) | - Zoothera spiloptera | -LR |
| ගෝමර තිරාසිකයා | - Zoothera wardii | -LR |
| පිළිලිච්චා | - Dicaeum vincens | -LR |
| වත සුදු ශාරිකාවා (හිස සුදු මයිනා) | - Sturnus senex | -LR |
| කැහි බෙල්ලා | - Urocissa ornata | -VU |

CR - අතිශයින් වඳවී යාමේ තර්ජනයට ලක් වූ
VU ÷ වඳ වී යා හැකි.
EN - වඳ වී යාමේ තර්ජනයට ලක් වූ
LR - අවදානමට ලක් වූ
DD - දත්ත නොමැති
NE - නිසි ඇගයීමක් නොමැති

*මූලාශ්‍ර : පරිසර පුවත්, 99 ඔක්තෝම්බර් සූරතිස්ස, ඩී.ඇම්. (2003), ජෛව, විවිධත්වය.*

මෙම ආවේනික සතුන් සහ ශාක වඳ වී යාමේ තර්ජනයට මුහුණ දීම තුළින් පෙන්නුම් කරන්නේ ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වය හීන වෙමින් පවතින බවයි. ඒ තුළින් පාරිසරික චක්‍රය අක්‍රමවත් වී,

විවිධාකාරයේ ගැටළු රාශියක් උද්ගත කරනු ලබන බවයි. මේ නිසා ලොව දනට පවතින වනාන්තර සහ ඒවායේ ජෛව විවිධත්වය සුරැකීම ජාත්‍යන්තර වගකීමක් බවට පත් ව ඇති අතර ගෝලීයකරණය හරහා එය සිදු කළ හැකිය.

මේ වන විට මිනිසාගේ නො සැලකිල්ල හා ආත්මාර්ථකාමිත්වය නිසා ලොව කොරල්පරවලින් 5%-10% අතර ප්‍රමාණයක් සහ කඩොලානවලින් අඩක් පමණ විනාශ වී ඇත. වෙරළවලින් 34%ක් පමණ ඉහළ අවදානමකට ලක් වී ඇති අතර, තවත් 17%ක් මධ්‍යම ප්‍රමාණයේ අවදානමකට ලක් ව ඇත. ලෝකයේ ගංගා සහ ඇලදොළ මාර්ගයෙන් වාර්ෂික ව අපද්‍රව්‍ය සහිත ජලය කියුබික් කිලෝමීටර් 450ක් පමණ ප්‍රමාණයක් මුහුදු වෙරළට එක් කරනු ලබයි. මෙම භයානක පාරිසරික දූෂණය අවම කිරීමට නම්, අතිරේක පිරිසිදු ජලය කියුබික් කිලෝමීටර් 6000ක ජල ප්‍රමාණයක් එකතු කිරීමට සිදු වෙතැයි ගණන් බලා ඇත. මෙම ජල ප්‍රමාණය ලොව පවතින ස්ථාවර ජල ප්‍රමාණයෙන් 2/3 කි. මුහුදු ජලය සම්බන්ධයෙන් වන තත්ත්වය මෙය වන අතර මුහුදු වෙරළ සම්බන්ධයෙන් ද එවැනි ම හෝ ඊට ඉහළ මට්ටමක තර්ජනයක් මිනිසා විසින් එල්ල කරනු ලබයි. සෑම වසරක ම ඉන්දියාවේ කල්කටා සහ බොම්බේ නගරවල පිළිවෙළින් කැලිකසල සහ නාගරික අපද්‍රව්‍ය මෙට්‍රික් ටොන් මිලියන 400ක් සහ 365ක් වෙරළ තීරයට එකතු කරනු ලබයි. චීනයේ වෙරළ පෙදෙසට දිනපතා පිරිපහදු නො කළ හෝ අර්ධ වශයෙන් පිරිපහදු කළ නාගරික අපද්‍රව්‍ය මෙ.ටො. මිලියන 50-60 අතර ප්‍රමාණයක් එකතු වේ. (පරිසර පුවත්, 1998 අප්‍රේල් - ජූනි,04) මෙම තත්ත්වය එම රටවලට පමණක් අහිතකර ප්‍රතිඵල ඇතිකරවන්නක් නොවන අතර ම ලොව පුරා විවිධ පාරිසරික ගැටළු උද්ගත කිරීමේ මූලික පියවරක් ලෙසින් පෙන්වා දිය හැකිය.

ශ්‍රී ලංකාවේ මුහුදු තීරයෙන් 2%ක් (කි.මී. 32ක්) පමණ ප්‍රදේශයක කොරල්පර පැතිරී පවතී. යාපනය අවට මුහුදු තීරය, කල්පිටිය සිට මන්නාරම් දූපත දක්වා වූ මුහුදු තීරය, ත්‍රිකුණාමලය සිට කල්මුනේ දක්වා නැගෙනහිර මුහුදු තීරය එසේ කොරල්පර විසිර පවතින ප්‍රදේශ වේ. ජෛව විද්‍යාත්මක වර්ගීකරණය අනුව කාණ්ඩ 68ට ඇතුළත් කොරල් විශේෂ 183ක් ශ්‍රී ලංකාවේ මුහුදු තීරය තුළ දකිය හැකිය. අයහපත් භූමි පරිභෝජනය, මසුන් ඇල්ලීමේ දී යොදා ගන්නා විනාශකාරි උපක්‍රම, හිරිගල් කැඩීම, සංචාරක ව්‍යාපාර සම්බන්ධ ක්‍රියාකාරකම්, මුහුදු ආශ්‍රිත කොහු කර්මාන්තය, ඇල්ගී වර්ග බෝ වීම, බෝට්ටුවලින් ජලයට මිශ්‍ර වන ඛනිජ තෙල්, කුණාටු හේතුවෙන් ඇතිවන රළ සාගර තරංග ආදිය හේතුවෙන් කොරල්පර විනාශ වේ.

ගෝලීයකරණය තුළ පරිසරය සම්බන්ධයෙන් උද්ගත කරනු ලබන තවත් ගැටළුවක් වන්නේ පරිසර දූෂණයයි. මේ වන විට රසායනික ද්‍රව්‍ය වර්ග 70,000ක් පමණ පරිසරයට හඳුන්වා දී ඇති අතර සෑම වසරක ම රසායනික ද්‍රව්‍ය වර්ග 1000 ක් පමණ අලුතින් හඳුන්වා දෙනු ලබයි. මේ නිසා පසට, ජලයට සහ වාතයට සිදුවන හානිය ඉමහත්ය. මෙම තත්ත්වය රෝග කිහිපයකට මූලික හේතුව ලෙසින් හඳුනාගෙන ඇත. මාරාන්තික පිළිකා රෝගයට බලපාන ප්‍රධාන හේතුවක් ලෙසින් පිළිකා කාරක කෘමි නාශක හඳුනාගෙන ඇත. ලොව පුරා කෘෂිකාර්මික කටයුතු සඳහා කෘමි නාශක සහ කෘෂි රසායනික ද්‍රව්‍ය බෙහෙවින් යොදා ගන්නා අතර තුන්වැනි ලෝකයේ රටවල ගොවීන් බොහෝ විට ආරක්ෂිත ක්‍රමයන්ගෙන් බැහැරව කෘමි නාශක භාවිතා කිරීම, අවශ්‍ය ප්‍රමාණයට වඩා සහ තම හිතුමතයට අනුව ඒවා පාවිච්චි කිරීම, ඒවායේ ඉවත දැමිය යුතු කොටස් ආනාරක්ෂිතව සහ පරිසරයට හානි සිදුවන ආකාරයෙන් ජල මාර්ගවලට මිශ්‍ර කිරීම ආදිය නිසා ජෛව විවිධත්වයට ද පාරිසරික චක්‍රයට ද බලවත් ලෙස හානි පැමිණීමත්, ප්‍රතිකාර සොයා ගැනීමට අපහසු හෝ මෙතෙක් සොයා නොගත් ලෙඩ රෝගවලට ගොදුරු වීමත් සිදු වේ. මේ වන විට ලොව පුරා වසරකට පිළිකා නිසා සිදුවන මරණ සංඛ්‍යාව මිලියන 06ක් වන අතර 2020 වන විට එය මිලියන 10 දක්වා ඉහළ යතැයි අපේක්ෂිතය. එමෙන් ම ජල දූෂණය නිසා වසරකට මිලියන 5-7 ප්‍රමාණයක් මිය යන අතර ජලය ආශ්‍රිත රෝගවලින් වසරකට මිය යන පුද්ගලයන් මිලියන 04ක් ළමුන් ලෙස ඇස්තමේන්තු කර ඇත. මේ අනුව පැහැදිලි වන්නේ පරිසර දූෂණය නිසා මේ වන විට ද ලොව අභියෝග සහ ප්‍රශ්න රාශියකට මුහුණ දෙමින් පවතින බවයි.

පරිසර දූෂණය හා බැඳුනු තවත් ප්‍රධාන ප්‍රශ්නයක් වන්නේ පිරිසිදු පානීය ජලය ලබා ගැනීමේ අපහසුතාවයි. ලෝක ජනගහනයෙන් 1/5ක් පිරිසිදු සෞඛ්‍යාරක්ෂිත පානීය ජලය ලබා ගැනීමේ අපහසුතාවෙන් පෙළෙන අතර ලොව නාගරික ජනගහනයෙන් 2/5ක් එම අපහසුතාවට මුහුණ දී සිටී. වසර 2025 වන විට ලොව රටවල් 40ක බිලියන 2.3ක් ජනතාවක් පානීය ජල හිඟයට මුහුණ දෙනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත. මෙය ඉතාමත් බැරෑරුම් ප්‍රශ්නයක් වන අතර වනාන්තර හෙළි කිරීමේ එක් භයානක

*11 වෙනි පිටුවට..........*

## 7 වෙනි පිටුවෙන්

**සංවර්ධනය සහ ගෝලීය.................**

ප්‍රතිවිපාකයක් ලෙසින් මෙය හඳුන්වා දිය හැකිය. තාක්ෂණයේ දියුණුවත් සමඟින් ගෝලීයකරණය වේගවත් වන සමාජයක අවශ්‍යතා සපුරාලීම සඳහා උපයෝජනය කෙරෙන ස්වාභාවික සම්පත් ශීඝ්‍රයෙන් ක්ෂය වීමේ අවදානමකට ලක්ව ඇති අතර ඉන් මතුවන ගැටළු සඳහා පිළියම් යෙදීම වෙනුවෙන් ද ගෝලීයකරණය උපයෝගී කර ගැනීමේ හැකියාවක් පවතී නම් එවැනි ප්‍රශ්න සඳහා සාර්ථක පිළියම් ලැබෙනු ඇත. එසේ නොමැති ව තනි තනි රටවල් වශයෙන් මෙවැනි ප්‍රශ්න නිරාකරණය කිරීම කෙරෙහි යොමු වීම තුළ ජාත්‍යන්තර බලපෑම් වලට මුහුණ දීමට නො හැකිවීමත්, එක් රටක පාරිසරික ප්‍රශ්න සමස්ත ලෝකයට ම බලපෑම් කිරීමත් නිසා සාර්ථක විසඳුමක් ලබා ගැනීමේ අපහසුතාව ඉස්මතු වේ. මේ නිසා එක් රටක පාරිසරික ප්‍රශ්නයක් වුව ද, පද්ධතියක එක් කොටසක් ලෙසින් සලකා සමස්ත ලෝකයට ම එහි ඇති බලපෑම තක්සේරු කරමින් ක්‍රියා කිරීම වඩා සාර්ථක වනු ඇත.